# ගොවිකටයුතු

## පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

වෙළුම 47 2023 දෙවන කලාපය ISSN 1991-040x




නැකතට පැළයක්



බ්‍රොයිලර් කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැය පිළිබඳ අධ්‍යයනයක්



වියළි කලාපයේ දේශගුණික විපර්යාසයන්හි බලපෑම පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණය



ජයග්‍රහණයේ මාවත පුහුණු වැඩසටහන



පුස්තකාලයට පොත් පරිත්‍යාගයක්...



## ගොවිමිණ පුවත්පත ජනපතිට පිළිගැන්වේ

ගොවි ජනතාවගේ වී බෝග අස්වන්නෙහි අග්‍රඵලය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජාකරනු ලබන ජාතික අලුත් සහල් මංගල්‍යය 2023 අප්‍රේල් මස දෙවන දින ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා මැති ඇමතිතුමන්ගේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුතුව අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි මළුවේදී උත්සවාකාරයෙන් පවත්වන ලදී.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ගොවිජනතාව හා කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙනුවෙන් ම සංස්කරණය කොට පළ කරනු ලබන 'ගොවිමිණ' ජාතික පුවත්පත ගරු ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වීම ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය ජී.ජී. බන්දුල මහතා විසින් මෙහිදී සිදුකරන ලදී.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් විසින් සිදුකරනු ලබන සමාජ - ආර්ථික පර්යේෂණවල සොයා ගැනීම්, නිර්දේශ හා යෝජනා වඩාත් පුළුල් ලෙස ගොවිජනතාව වෙත සන්නිවේදනය කිරීමේ මූලික අරමුණින් සහ ගොවිජනතාව වෙත කෘෂි තාක්ෂණය, ඒ හා සම්බන්ධ නව සොයා ගැනීම්, රාජ්‍ය ප්‍රතිපත්ති සන්නිවේදනය කිරීමේ අරමුණින් 2021 වසරේ නොවැම්බර් මස සිට ගොවිමිණ කෘෂිකර්ම ජාතික පුවත්පත ප්‍රකාශයට පත්කොට බෙදා හැරීම සිදු කරනු ලබයි.

පුවත්පත පිළිගැන්වීමේ අවස්ථාවට කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා ඇතුළු මැති ඇමතිවරු මෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශයේ උසස් නිලධාරිහු රැසක් සහභාගී වූහ.

# ගොවිමිණ දමිළ කලාපය කෘෂිකර්ම ඇමතිතුමන් අතට



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ගොවිමිණ කෘෂිකර්ම ජාතික පුවත්පතට සමගාමීව ප්‍රකාශයට පත් කරනු ලබන ගොවිමිණ දමිළ මාධ්‍ය සගරාවේ මංගල කලාපය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී බන්දුල මහතා විසින් කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා වෙත පිළිගන්වන අයුරු.

ගොවිමිණ පුවත්පතේ සංස්කාරක තුෂල් විතානගේ මහතා සහ සංස්කාරක මණ්ඩල සාමාජිකාවන් වන අභිෂේකි චමීරා මෙනෙවිය හා නදීෂා විජේරත්න මෙනෙවිය ද මෙහි සිටී.







## නැකතට පැළයක්

සිංහල හා දෙමළ අලුත් අවුරුදු චාරිත්‍ර හා සමගාමීව පවත්වන ලද 'නැකතට පැළයක්' ජාතික පැළ සිටුවීමේ මංගල්‍යය අනුව යමින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය ද එම ජාතික වශයෙන් වැදගත් කාර්යය සඳහා තම දායකත්වය දක්වන ලදි.

ඒ අනුව අප්‍රේල් මස 20 වන දින ආයතනයේ අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය ජී.ජී. බන්දුල මහතාගේ ප්‍රධානත්වයෙන් ආයතන පරිශ්‍රය තුළ අඹ පැළ රෝපණය කිරීමේ කෙටි උත්සවයක් පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ, ලේඛකාධිකාරී, පර්යේෂණ හා පුහුණු අංශ ප්‍රධානීන් සහ සෙසු සේවක මහත්ම මහත්මීන් ද සහභාගී වූහ.









# බ්‍රොයිලර් කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැය පිළිබඳ අධ්‍යයනයක්

**2021** වර්ෂයේ දී සාමාන්‍ය සිල්ලර මිල රු. 679ක් ව පැවති බ්‍රොයිලර් කුකුල් මස් කිලෝ එකක් 2023 වන විට රුපියල් 1126ක් දක්වා ඉහළ ගොස් ඇත. 2023 මැයි මාසය වනවිට එය රු. 1412ක් දක්වා ඉහළ ගොස් ඇති අතර තව දුරටත් මිල ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් පවතී. 2022 ජූනි මාසයේ සිට මේ දක්වා රතු සහ සුදු බිත්තර තොග සහ සිල්ලර මිල යන දෙකම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. බිත්තරවල සාමාන්‍ය සිල්ලර මිල 2021 වර්ෂයට සාපේක්ෂව 2022 දී දෙගුණයක් බවට පත්ව ඇත.

දිනෙන් දින නිෂ්පාදන පිරිවැය ඉහළ යාම තමන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවලින් එකක් බව කුකුළු මස් හා බිත්තර නිෂ්පාදකයෝ අවධාරණය කරති. කර්මාන්තයේ නියැළීමට නොහැකිව ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණයේ නිෂ්පාදකයින් කර්මාන්තයෙන් ඉවත්ව යාමේ ප්‍රවණතාවක් ද මතුව ඇත. කුකුළු මස් හා බිත්තර මෙරට ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා විශේෂ දායකත්වයක් ලබා දෙන බැවින් මිල ඉහළ යාම පාරිභෝගිකයන් කෙරෙහි ද අහිතකර ලෙස බලපා ඇත.



කෘෂිකර්ම අමාත්‍යාංශයේ පශු සම්පත් සංවර්ධන අංශය විසින් කරන ලද ඉල්ලීමකට අනුව බ්‍රොයිලර් කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැය පිළිබඳ අධ්‍යයනයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දත්ත කළමනාකරණ අංශය විසින් සිදු කරන ලදි.

**කුකුළු මස් නිෂ්පාදන පිරිවැය**

කුඩා පරිමාණ
සම සහිත රු.863.69
සම රහිත රු.912.59

මධ්‍ය පරිමාණ
සම සහිත රු.794.95
සම රහිත රු. 840.12

මහා පරිමාණ
සම සහිත රු.731.99
සම රහිත රු.773.14

**බිත්තරයක නිෂ්පාදන පිරිවැය**

කුඩා පරිමාණ
රු.43.81
මධ්‍ය පරිමාණ
රු.39.51
මහා පරිමාණ
රු.34.82

එම අධ්‍යයනයේ අරමුණු වන්නේ කුඩා පරිමාණ, මධ්‍යම පරිමාණ සහ මහා පරිමාණ නිෂ්පාදකයින් සම සහිත සහ සම රහිත කුකුළු මස් කිලෝග්‍රෑමයක් නිෂ්පාදනය කිරීමේ පිරිවැය ගණනය කිරීම සහ කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණ නිෂ්පාදකයින්ගේ බිත්තර නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම වේ.

අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා වයඹ පළාත තෝරාගෙන ඇත. පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් අහඹු ලෙස තෝරා ගත් නියැදියක් ආශ්‍රයෙන් සමීක්ෂණය සිදු කිරීමට නියමිතය. දත්ත කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන ප්‍රසන්න විජේසිංහ මහතා විසින් අධ්‍යයනයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි සාගරිකා හිටිහාමු මහත්මිය සහ පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රනාන්දු මහතා සම පර්යේෂකවරු ලෙස කටයුතු කරති.



# වියළි කලාපයේ දේශගුණික විපර්යාසයන්හි බලපෑම පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණය



**හෙ**ක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සහ රජරට විශ්වවිද්‍යාලය එක්ව සිදුකරනු ලබන 'ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාව සහ දේශගුණික අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය' නම් පර්යේෂණ අධ්‍යයනයට අදාළ දෙවන වටයේ ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු පසුගිය මැයි සහ ජූනි මාසවල දී සිදුකරන ලදී.

දේශගුණික අවදානමට ලක්වීමේ හැකියාව ඉතාමත් ඉහළ වියළි කලාපීය ගොවි ප්‍රජාවන්ගේ දේශගුණික-අනුහුරු ගොවිතැන් පිළිවෙත් සහ ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීමත් එම දේශගුණික-අනුහුරු වගා පිළිවෙත් කෙතරම් දුරකට කාන්තාවන්ගේ සහ ළමුන්ගේ දේශගුණික විපර්යාස හමුවේ දරාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ඉවහල්වී ඇතිද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වේ.

**රජරට**
**විශ්වවිද්‍යාලය**
**සමඟ**
**එක්ව**

**දිස්ත්‍රික්ක 4ක්**

**කිලිනොච්චිය**
**මඩකලපුව**
**මොණරාගල**
**හම්බන්තොට**

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 9ක්**

**ගොවිපවුල් 1058ක්**

කිලිනොච්චිය, මඩකලපුව, මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 9ක් තුළ මෙම පර්යේෂණ අධ්‍යයනයෙහි ක්ෂේත්‍ර කටයුතු සිදුකරනු ලදි.

දේශගුණික විපර්යාසයන්හි බලපෑම් සඳහා ඉහළ පාත්‍රීතාවයක් දක්වන සුළු වාරි හා වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ කෘෂිකාර්මික කටයුතු සිදුකරනු ලබන ගොවි ප්‍රජාවන් මෙම සමීක්ෂණයේ ඉලක්ක කණ්ඩායම විය.

කෘෂිකාර්මික කටයුතුවල නිරත ගොවිපවුල් 1058ක් අරභයා සිදුකරන ලද ප්‍රශ්නාවලි සමීක්ෂණයක් හරහා දත්ත එක්රැස් කිරීම මූලිකවම සිදු කරන ලද අතර ඊට අමතරව විවිධ ග්‍රාමීය ප්‍රජා කණ්ඩායම් සමග සිදුකරන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා මගින් ද ප්‍රාථමික දත්ත එකතුකිරීම සිදුකරන ලදී.

එමෙන්ම ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ නිලධාරින් සමග සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා ද මෙම ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු සාර්ථකව සිදුකිරීම සඳහා බෙහෙවින් ඉවහල් විය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පරිසර අංශය මගින් මෙම පර්යේෂණ අධ්‍යයනය ක්‍රියාත්මක කරනු ලබයි.

# ජයග්‍රහණයේ මාවත

## පුහුණු වැඩසටහන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ කාර්ය මණ්ඩලයේ ආකල්ප, දැනුම හා අත්දැකීම් ප්‍රවර්ධනය සඳහා සංවිධානය කරන ලද 'ජයග්‍රහණයේ මාවත' පුහුණු වැඩසටහන 2023 අප්‍රේල් මස 25 වන දින ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි.

ආයතනයේ අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය ජී.ජී. බන්ධුල මහතාගේ ප්‍රධානත්වයෙන් හා ලේඛකාධිකාරී බී.ආර්.සී. බණ්ඩාර මහතාගේ සහභාගිත්වයෙන් වැඩසටහනෙහි ආරම්භය සනිටුහන් විය. ආයතනයේ සංඛ්‍යාන සහකාර, කළමනාකරණ සහකාර සහ විමර්ශන නිලධාරි යන සේවා කාණ්ඩවලට අයත් සියලු ම සේවක මහත්ම මහත්මීන් ඉලක්ක කොට පවත්වන ලද මෙම පුහුණු වැඩසටහන අධ්‍යාපන හා පුහුණු අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි හා ප්‍රවීණ පුහුණු උපදේශක චතුර ජයම්පති මහතා විසින් මෙහෙයවන ලදී.














# HARTI පුස්තකාලයට පොත් පරිත්‍යාගයක්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙකු හා වියළි කලාපීය කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධ ප්‍රාමාණික පර්යේෂකයකු වන ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මැතිතුමා විසින් පරිශීලනය කරන ලද වටිනා ග්‍රන්ථ 600කට අධික සංඛ්‍යාවක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පුස්තකාලය වෙත පරිත්‍යාග කිරීම ජුනි 13වන දින සිදුවිය.

කලක් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයෙකු ලෙස ද සේවය කර ඇති ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මහතා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සමඟ පර්යේෂණ අධ්‍යයන හා පුහුණු කටයුතුවල දී ඉතාමත් සමීපව කටයුතු කළ විද්වතෙකි.

ආචාර්ය තෙන්නකෝන් මහතා අනාගත පර්යේෂකයන්ට මග පෙන්වීම සඳහා සංවර්ධන ආකෘති කිහිපයක් ගොඩනඟා ඇති අතර වියළි කලාපයේ එල්ලංගා ආශ්‍රිත වාරි කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයන්හි පෙරගමන්කරුවෙකි.

මෙම පොත් පරිත්‍යාග කිරීම සංකේතවත් කරමින් සංවිධානය කරන ලද කෙටි උත්සවයක් ආයතන පුස්තකාලයේ දී පැවති අතර එම අවස්ථාවට ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මැතිතුමා හා එම මැතිණිය සමග හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී බන්දුල මහතා සහ අතිරේක අධ්‍යක්ෂ (වැඩ ආවරණ) ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා ඇතුළු නිලධාරිහු පිරිසක් සහභාගී වූහ.

## මාසික ප්‍රසිද්ධ දේශන මාලා

**දෙවන කාර්තුව**

**සංවිධානය**
**අධ්‍යාපන හා පුහුණු අංශය**











# වෙසක් පොහොය නිමිත්තෙන් ධර්මදේශනාමය පිංකමක්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමය විසින් වෙසක් පොහොය නිමිත්තෙන් සංවිධානය කළ ධර්ම දේශනාමය පිංකම මැයි මස 03වන දින ආයතන පරිශ්‍රයේ දී පැවැත්වුණි. ධර්ම දේශකයාණන් වහන්සේ පූජ්‍යපාද හිඟුරේ පඤ්ඤාසේකර ස්වාමීන් වහන්සේය.







# HARTI සුහද ක්‍රිකට් තරඟාවලිය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමය විසින් සංවිධානය කළ සුහද ක්‍රිකට් තරඟාවලිය අප්‍රේල් මස 05වන දින වැලිකඩ බන්ධනාගාර ක්‍රීඩාංගනයේ දී පැවැත්වුණි.

ආයතනයේ සේවක මණ්ඩලය අතර සුහදතාව වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව පැවැත්වෙන ක්‍රිකට් තරඟාවලිය සඳහා කාන්තා සහ පිරිමි කණ්ඩායම් දෙක බැගින් තරඟ වැදුණහ.

තරඟාවලියේ පිරිමි ශූරතාව දිනා ගනු ලැබුයේ නුවන් වර්ණසූරිය මහතා නායකත්වය දැරූ කණ්ඩායමයි.

කාන්තා ශූරතාව නිරෝෂා දිසානායක මහත්මියගේ නායකත්වයෙන් යුතු කණ්ඩායම විසින් දිනා ගනු ලැබිණි.

තරඟාවලියේ වීරයන් ලෙස හෂාන් සහ නිරෝෂා දිසානායක යන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සම්මාන ලැබූහ.
















# ගොවිකටයුතු
## පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා පුහුණු වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ. ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.


*උපදේශකත්වය*

ආචාර්ය ජී.ජී බන්දුල
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

*අධීක්ෂණය*

ශාන්ත හේවගේ
අංශ ප්‍රධාන
තොරතුරු හා සන්නිවේදන අංශය

*සම්පාදනය*

වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

*නිර්මාණය හා පිටු සැකසුම*

උදේනි කරුණාරත්න

*ගොවිකටයුතු පුවත්හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදා හැරීම*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය



**0112 696981**

**0112 692423**

www.harti.gov.lk

https://www.facebook.com/hartilk

https://www.instagram.com/harti_lk/

http://twitter.com/harti_lk


# HARTI ප්‍රකාශන






























